# පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## අයදුම්පත් කැඳවීම

# අධ්‍යක්ෂ තනතුර

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2024 ජනවාරි 01 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 හි ප්‍රතිපාදන හා 1985 අංක 2 හා අංක 11 දරන ආඥා පනත ප්‍රකාරව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIAR) අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 63 ට වඩා අඩු විය යුතු අතර, 2025 මාර්තු මස 11 දින සිට බලපැවැත්වෙන මෙම නව තනතුරට අදාළ කළමනාකරණය හා නායකත්වය ලබාදීමට සුදුසුකම් හා පළපුරුද්ද සතු විය යුතුය.

අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණකාලීන නිලධාරියෙක් වේ. 1985 අංක 2 හා අංක 11 දරන ආඥාපනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරිය, ප්‍රධාන අධ්‍යයනාංශ නිලධාරියා හා ප්‍රධාන ගිණුම් නිලධාරිය වේ.

**තනතුරේ කාලසීමාව** : බඳවාගැනීමේ සිට අවුරුදු 03 ක් දක්වා

**අයදුම්පත් සමග පහත ලිපිලේඛන ඇතුළත් විය යුතුය.**

I. අයදුම්කරුගේ උපත් දිනය (උප්පැන්න සහතිකයේ සහතික කරනලද පිටපතක් ඇමිණිය යුතුය) හා සම්බන්ධිත විස්තර අඩංගු සම්පූර්ණ ජීවදත්ත තොරතුරු, (ආධාරක ලිපිලේඛන ඇතුළුව)

II. ආයතනයේ උන්නතිය පිළිබඳ පෞද්ගලික අදහස් ප්‍රකාශයක්

III. අධ්‍යක්ෂ තනතුරට බඳවාගනු ලැබුවහොත් අයදුම්කරු අපේක්ෂා කරන ඉලක්ක කරා ළඟා වන ආකාරය පිළිබඳ කෙටි හැඳින්වීමක්

IV. රාජ්‍ය අංශයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා උසස් අධ්‍යාපන ආයතනවල පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය හැර සේවය කරන අයදුම්කරුවන් විසින් මෙම තනතුර සඳහා ඔහු / හෝ ඇය තෝරාගනු ලැබුව හොත් ඔවුන් සේවය කරන ආයතනයෙන් මෙම තනතුර සඳහා නිදහස් කළ හැකි බව සඳහන් ලිපිය

2024 ජනවාරි 01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව තෝරාගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කෙරේ. මෙම චක්‍රලේඛය www.ugc.lk මගින් හා https://shorturl.at/HPrD7 දමය පිරික්සීමෙන් බාගත කළ හැක.

අයදුම්පත් / 2024 නොවැම්බර් 02 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙනසේ ලේඛනගත තැපෑලෙන් කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, අංක 407 හි පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සාමාන්‍ය පරිපාලන අංශයේ, පාලනාධිකාරී (කළමනාකරණ මණ්ඩල) ලේකම් වෙත, මුද්‍රා තබන ලද කවරයක / ලිපි කවරයක බහා එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, **"අධ්‍යක්ෂක තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සටහන්කර ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

මීට අමතරව ඉහත ලේඛනයේ PDF මාධ්‍යයෙන් සකසන ලද අනෙකුත් ආධාරක ලිපි ලේඛන සමග මුද්‍රා පිටපතක් ඊ-මේල් ඔස්සේ sarpgiar@kln.ac.lk වෙත එවිය යුතුය.

ඉහත උපදෙස්වලට අනුකූල නොවන සහ නියමිත අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබේ.

**කළමනාකරණ මණ්ඩලයේ ලේකම්,**
**සාමාන්‍ය පරිපාලන අංශය,**
**පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**2024.10.02**